**ශ්‍රී ලංකා කජු සංස්ථාව - 2018**
**-----------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා කජු සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ පිරිවැය රු.40,294,448 ක් වූ මෝටර් රථ 43 ක් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතියද ප්‍රමිත 16 ප්‍රකාරව එම මෝටර් රථ නැවත අගය කර මූල්‍ය ප්‍රකාශනවලට ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමේ ගැටළු සහගත තත්වයක් පවතින හෙයින් ප්‍රමාණවත් ප්‍රතිපාදන ලද වහාම ප්‍රත්‍යාගණන කටයුතු නිමකර ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ඇත. | මෝටර් රථයන්හි ඉදිරි ඵලදායී ජීව කාලය සලකා බලා අදාල ප්‍රත්‍යාගණන වටිනාකම් මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රමිත අංක 19 හි 139 වන ඡේදය ප්‍රකාරව විශ්‍රාමික පාරිතෝෂික ගෙවීම සඳහා රු.27,703,878 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද, ඒ සඳහා අනාගත වගකීම් ඇතිවීමේ අවදානම අවම කර ගැනීම සඳහා විශ්‍රාමික පාරිතෝෂික බැඳියාව සම්බන්ධයෙන් ආයෝජන සැලැස්මක් ඇති කර ගත යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | විශ්‍රාමික පාරිතෝෂික ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ප්‍රතිපාදන නියමිත කාල සීමාව තුල නොලැබීම නිසා ආයෝජන සැලැස්මක් සකස් කර ගැනීමේ හැකියාවක් නොමැති වී ඇත. මූල්‍ය තත්ත්වය යහපත් වූ විට මේ කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ. | අනාගත වගකීම් අවදානම අවම කිරීම සඳහා ආයෝජන සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැඩ අවසන් කිරීම හේතුවෙන් කෙරීගෙන යන වැඩ ගිණුමෙන් ගොඩනැගිලි ගිණුමට මාරු කරන ලද රු.1,726,013 ක ශේෂය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒමක් ලෙස දක්වා තිබුණි. | අදාල නිවැරදි කිරීම් සිදුකර සංශෝධිත මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | සත්‍ය වශයෙන්ම වර්ෂයට අදාල තථ්‍ය මුදල් ගලා ඒම් පමණක් සැලකිල්ලට ගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 41 ප්‍රකාරව පාරිභෝජ්‍ය ජීව වත්කම් සාධාරණ වටිනාකමට අගය කර ගිණුම්ගත කළ යුතු වුවත්, සංස්ථාව සතු පාරිභෝජ්‍ය ජීව වත්කම් වන කජු වගාවන් වල සාධාරණ වටිනාකමට අගය කිරීමකින් තොරව ජීව වත්කම් ලෙස රු.79,026,608 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | විගණකාධිපති වාර්තාවෙන් මෙම විගණන ඡේදය ඉවත් කිරීමට එවකට සිටි විගණන නිලධාරින් විසින් කටයුතු කළ බව වැඩිදුරටත් දැනුම් දෙයි. | ප්‍රමිති අංක 41 ප්‍රකාරව ජීව වත්කම් සාධාරණ වටිනාකමට ගිණුම් ගත කළ යුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | අවසන් තොග<br>කජු මද<br>කජු ඇට<br>කජු පැළ | <br><br>7,589,946<br>3,570,764<br>3,167,807 | අවසන් තොගවල පැවැත්ම තහවුරු කර ගැනීම සඳහා තොග වාර්තා | සියළු තොග සම්බන්ධයෙන් වූ වාර්තා සංස්ථාව සතුව පවතී. | අවසන් තොගවල පැවැත්ම තහවුරු කර ගැනීමට අදාළ මූලාශ්‍ර වාර්තා ඉල්ලුම් කළ පරිදි විගණනයට ඉදිරිපත් කළ යුතු වීම. |
| (ආ) | හානි වූ කජු පැළ | 1,007,126 | හානි වූ කජු පැළ සම්බන්ධව හානි වූ පැළ පිළිබඳ වාර්තා | පැළ තවාන්වල අධීක්ෂණ නිලධාරින් විසින් ප්‍රධාන කාර්යාලයට එවනු ලබන තොරතුරු අනුව ගිණුම්ගත කර ඇත. අදාල වාර්තා ඉදිරිපත් කිරීමේ හැකියාව පවතී. | හානි වූ පැළ සම්බන්ධ වාර්තා විගණනයට ඉදිරිපත් කළ යුතු වීම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | විවිධ ණයගිම් යෝ | 853,000 | ණයගිමියන්ට අදාල ශේෂ සනාථන ලිපි | ශේෂ සනාථන ලිපි හැකි ඉක්මනින් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | ණයගිමි ශේෂවල නිවැරදිතාවය තහවුරු කර ගැනීම සඳහා ශේෂ සනාථ ලිපි විගණනයට ඉදිරිපත් කළ යුතු වීම. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රු.17,483,950 ක ශේෂයෙන් රු.13,263,982 ක ශේෂයක් වර්ෂ 07 කට වැඩි කාලයක් අය නොවී තිබියදී, එම ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මෙම ශේෂයන් අයකර ගැනීමට කටයුතු කරනු ඇත. | අයවිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු රු.23,691,408 ක ශේෂයෙන් රු.4,923,343 ක ශේෂ වසර 07 කට වැඩි කාලයක් පැවති අතර රු.709,250 ක ශේෂ වර්ෂ 03-07 ක් අතර පැවතියද එම ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අදාල ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත. | ගෙවිය යුතු ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දක්වා ඇත.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1983 අංක 12 දරන සේවක පාරිතෝෂික පනත | සේවකයා සේවයෙන් විශ්‍රාම ගොස් මසක් ඇතුළත පාරිතෝෂික ගෙවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ විශ්‍රාම ගන්වන ලද සේවකයින් 05 දෙනෙකු වෙනුවෙන් රු.2,108,918 ක මුදලක් 2019 මැයි 31 දින දක්වාම ගෙවීමට කටයුතු කර නොතිබුණි. | සංස්ථාවේ මූල්‍ය දුෂ්කරතා මත පාරිතෝෂික ගෙවීම් ප්‍රමාද වී ඇති අතර ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන ලද වහාම ඉතිරි ගෙවීම් සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ලැබේ. | සේවක පාරිතෝෂික පනතට අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) 2012 ජුලි 24 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා තීරණය | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නීත්‍යානුකූල අයිතිය නොමැති ඉඩම් වල අයිතිය පවරා ගැනීමට කටයුතු කරන ලෙස දැනුම් දී තිබුණ ද, කජු වගා කරන ඉඩම් අක්කර 15,329 ක නීත්‍යානුකූල අයිතිය සංස්ථාවට පවරා ගැනීමට අදාල කටයුතු 2019 මැයි 31 දින දක්වාම නිම කර නොතිබුණි. | ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීම සඳහා සම්පූර්ණ කළ යුතු ක්‍රියාවලියට ඉතා දීර්ඝ කාලසීමාවක් ගතවන අතර රේඛීය අමාත්‍යාංශය හා එක්ව අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා තීරණවලට අනුව වාර්තා කිරීමට කටයුතු කළ යුතුය. |

**1.8 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 ඔක්තෝබර් 27 දිනැති අංක 24 දරන දේශීය ආදායම් පනත අනුව සංස්ථාව ආදායම් බදු, බැදියාවට යටත් ආයතනයක් වන නමුත් 2012 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ආදායම් බදු ගෙවීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල ආදායම් බදු ප්‍රකාශන සකස් කරගෙන යනු ලැබේ. වර්ෂ කිහිපයකම ආදායම් ප්‍රකාශන සකස් කළ යුතු බැවින් යම් කාල ප්‍රමාදයක් පවතී. | පනත අනුව ආදායම් බදු ගෙවීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | 2018 අංක 25 දරන (සංශෝධිත) එකතු කළ අගය මත බදු පනත සහ 2018 අංක 20 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත අනුව බදුවලට යටත් භාණ්ඩ, සේවා හෝ සැපයුම් වාර්ෂිකව රු.12,000,000 ඉක්මවන්නේ නම් එකතු කළ අගය මත බදු (VAT) සහ ජාතිය ගොඩනැගීමේ බදු (NBT) ගෙවීම සඳහා ලියාපදිංචි වී ගෙවීම් සිදු කළ යුතුය. එසේ වුවත් සංස්ථාව විසින් 2018 වර්ෂය සඳහා රු.94,930,802 ක පිරිවැටුමක් තිබියදීත් VAT සහ NBT සඳහා ලියාපදිංචි වී අදාල බදු ගෙවීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙහි සඳහන් බදු විකුණුම් මිලට අහිතකර බලපෑමක් නිර්මාණය විය හැකි බැවින් විශේෂ බදු සහනයක් ලබා ගැනීම සඳහා රේඛීය අමාත්‍යාංශය හරහා මුදල් අමාත්‍යාංශය වෙතින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. ලැබෙන ප්‍රතිචාර මත ඉදිරි කටයුතු සිදු කිරීමට තීරණය කර ඇත. | පනතට අනුව බදු ගෙවීම් කිරීමට කටයුතු කළ යුතු වීම. |

**2 මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මෙහෙයුම් කටයුතු වලින් රු.39,642,728 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.42,335,722 ක් විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී ඌනතාවය රු.2,692,994 ක අඩුවීමක් නිරීක්ෂණය විය. වාණිජ අංශයේ විකුණුම් පිරිවැය රු.19,159,397 කින් අඩු වීම ඊට ප්‍රධානම හේතුව වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් නියමිත පරිදි නොගෙවීම මත සමාලෝචිත වර්ෂයේ අධිභාර ලෙස රු.103,787 ක මුදලක් ගෙවීමට සිදු වී තිබුණි. | සංස්ථාවේ මූල්‍ය දුෂ්කරතා හේතු කොටගෙන නියමිත කාල සීමාව තුලදී සේවක අර්ථසාධක අරමුදල් ගෙවීමට නොහැකි වීමෙන් අයභාර ගෙවීමට සිදු වී ඇත. | සේවක අර්ථසාධක අරමුදල් පනතට අනුව දායක මුදල් ගෙවීමේ කටයුතු සිදු කල යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ලෙලි කජු කිලෝ ග්‍රෑම් එකක වෙළඳපොළ මිල රු.390 ත් රු.505 ත් අතර පරාසයක වුවද සංස්ථාවේ වතුවල ලෙලි කජු කිලෝ ග්‍රෑම් එකක නිෂ්පාදන පිරිවැය රු.541 ත් රු.2,679 ත් අතර පරාසයක පැවතුණි. ඒ අනුව නිෂ්පාදන පිරිවැය අවම කිරීම සඳහා කළමනාකරණය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග ප්‍රමාණවත් නොවන බව තහවුරු විය. | මේ සඳහා අදාල වන ඍජු වියදම්ද ඇතුළුව අනෙකුත් සියළු වියදම් සැලකිල්ලට ගෙන නිෂ්පාදන පිරිවැය ගණනය කර ඇත. ඍජු පිරිවැය පමණක් සැලකිල්ලට ගෙන නිෂ්පාදන පිරිවැය ගණනය කර වෙළඳපොළ මිල සමඟ සැසඳීම නිවැරදි බව අපගේ හැඟීමයි. පිරිවැය අවම කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇත. | සංස්ථාව සතු වතුවල කජු නිෂ්පාදන පිරිවැය අවම කිරීම සඳහා ප්‍රායෝගික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සංස්ථාව සතු වතුවලින් සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ අස්වැන්න ලෙලි කජු කිලෝ ග්‍රෑම් 99,119 ක් වූ අතර ලැබී තිබූ ඇණවුම් සම්පූර්ණ කර ගැනීම සඳහා එය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් බාහිරවද කජු මද කිලෝ ග්‍රෑම් 6,299 ක් මිලදී ගැනීමට සිදු වී තිබුණි. ඒ අනුව වතුවල නිෂ්පාදනය වැඩි කර ගැනීමට හා වතුවලින් ලැබෙන අස්වැන්න නිසි ලෙස කළමනාකරණය කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග ප්‍රමාණවත් වී නොතිබුණි. | කජු අස්වනු සමයේ පැවති කාලගුණ හා දේශගුණ තත්වයන්ගේ බලපෑම මත ඉලක්කගත මුළු කජු අස්වනු ප්‍රමාණය ලබා ගැනීමට නොහැකිවීමෙන් පිරිසැකසුම් කටයුතු සඳහා ඇණවුම් සම්පූර්ණ කර ගැනීමට බාහිරින් කජු මිලදී ගැනීමට සිදු විය. | නිෂ්පාදනය වැඩිකර ගැනීමට හා අස්වනු නිසිලෙස කළමනාකරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සුදුවතුර ආර බීජ උද්‍යානයට අයත් අක්කර 160 කට ආසන්න ප්‍රමාණයක් සහ කමන්දළුව වතු යායේ, ඔට්ටුකුලම කොටසේ වූ ඉඩමේ අක්කර 10 ක ප්‍රමාණයක් බාහිර පාර්ශවයන් විසින් අත්පත් කරගෙන කන්න භෝග සහ බුලත් ඇතුළු වගාවන් සිදුකරමින් පැවතුණද මෙම ඉඩම් නැවත අත්පත් කර ගැනීම සඳහා අවශ්‍ය නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | කමන්දළුව වතුයායේ සහ බීජ උද්‍යානයේ ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් සංස්ථාව මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග විගණනයට ඉදිරිපත් කර ඇත. (පොලිසියට පැමිණිලි කර ඇත) | සංස්ථාව සතු ඉඩම් බාහිර පාර්ශවයන් විසින් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | 2013 ජුනි 04 දින සිට ක්‍රියාත්මක කර තිබුණු වෛද්‍යාධාර යෝජනා ක්‍රමය සඳහා මාසිකව සේවකයන්ගේ වැටුපෙන් ගාස්තු අයකරමින් පැවතියද මෙම යෝජනා ක්‍රමය යටතේ සේවකයින් විසින් බාහිර ප්‍රතිකාර සහ රෝහල්ගත ප්‍රතිකාර වෙනුවෙන් ඉදිරිපත් කරන ලද බිල්පත් සඳහා වර්ෂ 02 ක කාලයක සිට වියදම් ප්‍රතිපූර්ණය කර නොතිබුණි. | සංස්ථාවේ මූල්‍ය දුෂ්කරතාවයන් මත මෙම වෛද්‍යාධාර ගෙවීම් ප්‍රමාද වී ඇත. මූල්‍ය දුෂ්කරතාවයන් යහපත් වූ වහාම මෙම ගෙවීම් සියල්ල සම්පූර්ණ කරනු ලැබේ. | වෛද්‍යාධාර යෝජනා ක්‍රමයට අදාල බිල්පත් ගෙවීමට කටයුතු කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංස්ථාව විසින් කජු පැළ බෙදා දීමේ සහනාධාර වැඩසටහන යටතේ 2015 වර්ෂයේ බෙදා දෙන ලද බීජ හා බද්ධ කජු පැළ 275,320 කින් පැළ 208,921 ක් අසාර්ථක වී තිබූ අතර 2016 වර්ෂයේදී බෙදා දෙන ලද බීජ හා බද්ධ කජු පැළ 258,700 කින් පැළ 142,344 ක් අසාර්ථක වී තිබුණි. මැයි,ජුනි මාස තුළ බීජ අංකුර ලබාගෙන පැළ රෝපණය කර සහනාධාර වැඩසටහන් යටතේ වර්ෂය අවසාන කාර්තුව තුළදී රෝපණය වෙමින් පවතින කාලගුණ තත්වයට ඔරොත්තු දීමේ ශක්තියක් නොමැති පැළ බෙදා දීමත්, සංස්ථාවේ කජු සංවර්ධන නිලධාරීන් 27 ක් පුරප්පාඩු වී තිබීමත්, එක් නිලධාරියා ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ කිහිපයක අධීක්ෂණ කටයුතු සිදු කිරීමත් එම අසාර්ථක වීමට හේතු වී තිබුණත් මේ සඳහා සංස්ථාව විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කජු පැළ විනාශ වීමට ජලය නොමැති වීම, වන සතුන්ගෙන් හානි, කාලගුණික හා පාරිසරික බලපෑම්, ඇතැම් විවිධ හේතු බලපා ඇති අතර මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ක්‍රියාමාර්ග කිහිපයක් ගෙන ඇත. කජු සංවර්ධන නිලධාරිනියන්ගේ හිඟයට සංස්ථාවේ මූල්‍ය දුෂ්කරතාවය බලපා ඇති අතර එය යහපත් වූ වහාම නව බඳවා ගැනීම් සිදු කර රාජකාරී පැවරීම සිදු කරනු ඇත. | කාලගුණ හා පාරිසරික බලපෑම්වලට ඔරොත්තු දීමේ හැකියාව පවතින පරිදි පැළ රෝපණය කිරීමට සැලසුම් කිරීමත් කජු සංවර්ධන නිලධාරීන්ගේ පුරප්පාඩු පිරවීමටත් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ පුත්තලම හා කමන්දළුව පර්යේෂණ මධ්‍යස්ථාන සඳහා රු.3,388,611 ක් වැයකර තිබුණද, සමාලෝචිත වර්ෂය තුල කජු වගාව සහ අතුරු නිෂ්පාදන පිළිබඳව නව පර්යේෂණ කිසිවක් ආරම්භ කර නොතිබූ අතර මධ්‍යස්ථාන දෙකෙහිම පෙර වර්ෂවල සිට ඉදිරියට එමින් පැවති පර්යේෂණ 08 ක් පමණක් සිදුවෙමින් පැවතුණි. | සංස්ථාවේ කජු පර්යේෂණ කළමනාකරණ කමිටුවේ සමාලෝචනයන් සිදු කරන අතර එම කමිටු වාර්තා අවශ්‍ය තීරණ ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබයි. | පර්යේෂණ මධ්‍යස්ථානවල ප්‍රගතිය සමාලෝචනය සඳහා ප්‍රගති වාර්තා සකස් කළ යුතුව ඇති අතර අතුරු නිෂ්පාදන පිළිබඳව නව පර්යේෂණ කටයුතු ආරම්භ කිරීමටත් කටයුතු කළ යුතුව ඇත. |

**3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල පිරියත හා උපකරණ**

-----------------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුත්තලම කජු පිරිසැකසුම් මධ්‍යස්ථානයේ කජු තැම්බීම සඳහා යොදා ගන්නා ලද වසර 24 කට වඩා පැරණි බොයිලේරු පද්ධතිය වර්ෂ 10 ක පමණ කාලයක සිට ක්‍රියා විරහිතව පැවතියද එම බොයිලර් පද්ධතිය අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | දැනට බොයිලේරුව ඉතා අබලන් තත්වයේ පවතින බැවින් භාවිතයට ගැනීම සුදුසු නොවන බව කාර්මික නිලධාරි විසින් ප්‍රකාශ කර ඇත. එහෙයින් ඉදිරියේදී අපහරණය කිරීමට කටයුතු සිදු කරනු ඇත. | භාවිතයට ගත නොහැකි බැවින් අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

---------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේ එළුවන්කුලම බීජ උද්‍යානයේ කජු වියලන කමතක් හා ගොඩනැගිල්ලක් රු.2,389,757 (බදු සමඟ) ක් වැයකර ඉදිකර තිබුණද අදාළ කාර්යයන් විධිමත් අධීක්ෂණයකින් තොරව සිදුකිරීම නිසා කමතෙහි කොන්ක්‍රීට් කරන ලද පොළොවෙහි කොන්ක්‍රීට් අතුරනය සහ H අයන් බාර් ව්‍යුහය අතර, බ්ලොක් ගල් යොදා සම්පූර්ණ කර තිබූ බිත්ති පුපුරා ගොස් තිබුණි. එමෙන්ම එහි H අයන් බාර් පෙර පැවති අත්තිවාරමට (Foundation) සම්බන්ධ කර තිබීමෙන් අත්තිවාරම තැනින් තැන පුපුරා ගොස් තිබූ නමුත් මෙම අඩුපාඩු නිවැරදි කිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. | අලුත්වැඩියා කිරීමේ දෝෂයක් නිවැරදි කරන ලෙස කොන්ත්‍රාත්කරු වෙත දන්වා ඇත. එම කටයුතු නිම කරන තෙක් කොන්ත්‍රාත්තුවේ රැඳවුම් මුදල් නිදහස් කිරීමට කටයුතු කරනු නොලැබේ. | ඉදිකිරීම් කටයුතු වල ප්‍රමාණාත්මක අඩුපාඩු තිබියදී එය නොසලකා ගෙවීම් නිර්දේශ කළ නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින් ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව ශ්‍රී ලංකා කජු සංස්ථාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධව දැනුවත් වී නොමැත. ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත. | තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |